දිවයින 2019 ඔක්තෝබර් මස 08 වැනිදා අඟහරුවාදා

දැන්වීම් අතිරේකය



ජාතික විශ්‍රාමිකයන්ගේ දිනය

ඔක්තෝබර් 08

ජීවිතයේ සැඳෑ සමය අභිමානවත් ලෙස ගතකිරීමට රාජ්‍ය වගකීමක් ඇති විශ්‍රාම වැටුපකට අනුගත වෙමු

ශ්‍රී ලංකාවේ දියුණු සෞඛ්‍ය පහසුකම්, ආයු අපේක්ෂාව ඉහළ යෑම, මාතෘ හා ළදරු මරණ අනුපාතිකයන් අඩුවීම ආදී හේතු මත කලාපයේ අනෙකුත් රටවල් හා සැසඳීමේදී මෙරට ජනගහනය වේගයෙන් වියපත් වන බව අනාවරණය වී ඇත. 2021 වනවිට මෙරට අවුරුදු 60 ට වැඩි ජනගහනය 16.7% දක්වා ද 2041 දී එම අගය 24.8% දක්වා ද ඉහළ යනු ඇති බව ශ්‍රී ලංකා මහ බැංකු දත්ත වාර්තා පෙන්වා දෙයි.

ඒ අනුව 2041 වනවිට සෑම පුද්ගලයන් 04 දෙනකුගෙන්ම එක් අයකු අවුරුදු 60 හෝ ඊට වැඩි වයස්ගත වූවකු වීමය. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්තයන්ට අනුව අවුරුදු 60 ට වැඩි පිරිසගෙන් බහුතරයක් (55.3%) ඔවුන්ගේම ආර්ථික කටයුත්තක නියැලෙන්නන් වන අතර ඔවුන් 50% කටම විශ්‍රාම වැටුපකට හිමිකම් නොමැති බවත්ය. 2017 වර්ෂයේ දත්ත අනුව තවදුරටත් පෙනී යන්නෙ මෙරට ශ්‍රම බළකායෙන් 58% ක්ම අවිධිමත් අංශයේ රැකියාවල නිරත වන අය වන අතර, ඔවුන් විශ්‍රාම යෑමේදී කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයකට හිමිකම් නොකියන බවත්ය.

මෙවන් ජනගහනය වයස්ගතවීමත් සමඟ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාමික දිවිය සෞඛ්‍යමය, සමාජීය හා ආර්ථිකමය රැකවරණය තහවුරු කිරීම යන ප්‍රධාන අභියෝගයන්ට මුහුණ පැමට සිදුවනු නියතයකි.

එහිදී ස්වයං රැකියා නියුක්තිකයන් පමණක් නොව ඉන් ඔබ්බට ගොස් විධිමත් හා අවිධිමත් යන සියලු අංශයන්හි නියුතු ශ්‍රමිකයන්ගේ සැඳෑ සමය සෞභාග්‍යයමත් කිරීමට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැලසීමෙහිලා අනිකුත් සමාජ ආරක්ෂණ ක්‍රම තුළ පවත්නා අඩුලුහුඬුකම් ද පිටුදකිමින් සමාජ ආරක්ෂණ මණ්ඩලය පූර්ණ රජය වගකීමක් සහිතව රජය සතු වගකීම ඉටුකරමින් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම කීපයකි. වයස අවුරුදු 18 - 59 දක්වා පුද්ගලයන් සඳහා 'සුරැකුම' විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන අතර, වයස අවුරුදු 18 අඩු දරු දැරියන් සඳහා 'ආරස්සාව' පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත.

මේ වනවිට දිවයිනේ දිස්ත්‍රික්ක 25 හි ම ක්‍රියාත්මක මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයන්ට වයස අවුරුදු 18 - 59 අතර රජයේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන, ඕනෑම ක්ෂේත්‍රයක රැකියාවක නියුතු කුමන හෝ ආදායම් තත්ත්වයක අයකුට වුව ද සාමාජිකත්වය ලබාගත හැකි අතර තමන් කැමැති විශ්‍රාම වැටුපක් වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා ලබාගැනීම සඳහා අදාළ වන වාරිකය අදාළ සාමාජිකයා විසින්ම තීරණය කරගැනීමේ හැකියාව ද පවතී.

'සුරැකුම' විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ හිමිකරුවකුට පහත ප්‍රතිලාභ හිමිවේ.

වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුපක් හිමි වීම.

විශ්‍රාම හිමි සාමාජිකයා වයස අවුරුදු 80 සම්පූර්ණවීමට පෙර මියගියහොත් කලත්‍රයා ජීවත්ව සිටී නම් විශ්‍රාමිකයාගේ වයස අවුරුදු 80 දක්වා එම විශ්‍රාම වැටුප කලත්‍රයාට මාස් පතා ගෙවනු ලැබේ. එමෙන්ම කලත්‍රයා නොමැති නම් දායකයාගෙන් පසු උරුමකරුවන්ට දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල හා පොලිය ආපසු ලබාගැනීමට හැකි වේ.

එමෙන්ම සාමාජිකයා ස්ථිර අර්ධ අබලතාවන්ට පත්වුවහොත් වයස අනුව ගැලපූ පාරිතෝෂිකයක් සහ නියමිත පරිදි වාරික ගෙවීමෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ද හිමිවනු ඇත.

ස්ථිර පූර්ණ අබලතාවට පත්වුවහොත් වයස අනුව ගැලපූ පාරිතෝෂිකය ශුද්ධ දායක මුදල සමඟ හෝ පූර්ණ අබලතාවට පත් වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවන මාසික විශ්‍රාම වැටුපක් හිමි වේ.

පී. එම්. දේවක වීරසිංහ
(සභාපති)

විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර පාරිතෝෂිකයක් ගෙවනු ලැබේ.

'ආරස්සාව' පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය 'සුරැකුම' යෝජනා ක්‍රමයට පූර්ව සැලසුම් ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. ඒ මඟින් වයස අවුරුදු 18 ට අඩු ඕනෑම දරුවකු වෙනුවෙන් මවුපිය භාරකාරත්වය යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් ක්‍රමයකි.

මේ යටතේ දරුවන්ට හිමිවන ප්‍රතිලාභ

රුපියල් 10,000 කට වැඩි විශ්‍රාම වැටුපක සාමාජිකත්වය ලබාගැනීමෙන් යෝජිත ප්‍රතිලාභය වන විශ්‍රාම වැටුපට අමතරව,

I. 5 වසර ශිෂ්‍යත්වය අවම කඩඉම් ලකුණු ලබා සමත්වීමේදී විශ්‍රාම වැටුප් වටිනාකමින් 50% ක ප්‍රසාද දීමනාවක් හිමි වේ.

II. අ.පො.ස. (සා/පෙළ) විභාගය අධි සාමාර්ථ 5 ක් සහිතව සමත් වුවහොත් විශ්‍රාම වැටුපට සමාන ප්‍රසාද දීමනාවක් හිමි වේ.

III. අ.පො.ස. (උ/පෙළ) සමත්ව ජාතික

සැමට
රජයේ
විශ්‍රාම වැටුපක්